# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2445/49 – 2025 ජූලි මස 17 වැනි බ්‍රහස්පතින්දා – 2025.07.17**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. - 277/40

**(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

33 වන වගන්තිය යටතේ වූ නියමය

(188 වන අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ 33 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් දැලත් තුසිත මැන්දිස් වන මා විසින්, ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය සහිතව, මේ නිවේදනය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති රජයේ ඉඩම් කොටස එකී ආඥාපනතේ කාර්ය සඳහා "පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන්කළ භූමියක්" විය යුතු බවට ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**දැලත් තුසිත මැන්දිස්,**
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් .

2025 ජූලි මස 08 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

**පුරාවිද්‍යාත්මක කටයුතු සඳහා වෙන්කළ කඩවත්ගම රජපිහිල්ල භූමි ප්‍රදේශය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පළාත කෝරළයේ (යටිනුවර) අංක 204, කඩවත්ගම ග්‍රාම නිලධාරී වසමේ, කඩවත්ගම යන ගමේ පිහිටි, "කඩවත්ගම රජපිහිල්ල" නමැති ඉඩමට සර්වේයර් ජනරාල් විසින් මැන සාදන ලද අනුරේඛන අංක Maha/YIN/2023/605 හා 2023.10.20 දින දරන පිඹුර ප්‍රකාරව කැබලි අක්ෂර 'A' දරන බිම් කොටස ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම දොළහක් (පර්. 7.12) හෙවත් හෙක්. බින්දුවයි දශම බින්දුවයි එකයි අටයි බින්දුවක් (හෙක් 0.0180) කින් යුක්ත වූ ප්‍රදේශය පහත පරිදි:

*උතුරට* : හේරත් රණසිංහට අයත් ලී මගස්කොටුව ගෙවත්ත;
*නැගෙනහිරට* : හේරත් රණසිංහට අයත් ගෙවත්ත සහ කැබලි අක්ෂර C;
*දකුණට* : අඩිපාර සහ කැබලි අක්ෂර C;
*බටහිරට* : ඇල සහ අඩිපාර.

සමන්විත වේ.


අනුරේඛණ අංක : Maha/YIN/2023/605

කඩවත්ගම රජපිහිල්ල සහිත ඉඩම

පරිමාණය : 1:500

යටිනුවර ප්‍රාදේශීය ලේකම්ගේ අංක KDS/YNU/4/79/2023 / KDS/YNU/4/6/2/174 සහ 2023.අ.24 දින
(ස.ප.ගේ අංකය :- Maha/YIN/2023/605)

: කඩවත්ගම
: මැදපළාත කෝරළය (යටිනුවර)
: යටිනුවර
: මහනුවර
: මධ්‍යම



| ඉඩම් අංකය | ඉඩමේ නම | වර්තමාන ඉඩම් පරිහරණය | හිමිකම් කියන්නා | වර්ග ප්‍රමාණය හෙක්ටයාර් | අ | රූ | පර් | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| (A) | | ඇළ | රජය | 0.0180 | 0 | 0 | 07.12 | |
| (1) | | අඩි පාර | නොදන්නා කොටස | 0.0029 | 0 | 0 | 01.14 | |
| (1) | | ඩිවංග මුඩුබිම | නොදන්නා කොටස | 0.0045 | 0 | 0 | 01.78 | |
| (1) | | වත්ත අවු. 2-3 ක් පමණ වයසැති මිශ්‍රබෝග වගාවක් ඇත. | නොදන්නා කොටස | 0.0084 | 0 | 0 | 03.35 | ඩබ්.එම්.චන්ද් බණ්ඩාර විසින් වගා කර ඇත. |
| | | | එකතුව | 0.0338 | 0 | 0 | 13.39 | |

කොට්ඨාශ අංක 204, කඩවත්ගම ග්‍රාම නිලධාරී
කේ.සුරේකා චන්ද්‍රසිරි , ඩබ්.එම්.චන්ද් බණ්ඩාර,
හේරත් රණසිංහ සහ නාමල් ඉලංකෝන්

ගොනු පොත් අංක : මහ 10103

ඩබ්.එම්.ධර්මසිරි බණ්ඩා
රජයේ මිනින්දෝරු
(W.M.Dharmasiri Banda, Govt. Surveyor)
2023 ඔක්තෝබර් මාසයේදිය.

ටී.එම්.පී.අයි.එන්.තෙන්නකෝන්
මිනින්දෝරු අධිකාරී
(T.M.P.I.N.Thennakoon, Supdt. of Surveys)
2023.10.20

ඊ.එම්.පී.යූ.ඒකනායක
ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී, මහනුවර දිස්ත්‍රික්කය
(E.M.P.U.Ekanayake, Snr. Supdt. of Surveys)
සර්වේයර් ජනරාල් වෙනුවට
2023.10.20



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.